# අ.පො.ස. (උ. පෙළ) උසස් සාමර්ථ්‍යය ලත් සිසුන් අනුගමනය කරන ලද ඉගෙනුම් පුරුදු වල ස්වභාවය පිළිබඳව කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්


ඇම්. ඩී. ලංකාතිලක
ශාස්ත්‍රවේදී විශේෂ (ආර්ථික විද්‍යාව)(ගෞරව) දෙවන පෙළ (කො.වි.වි.)
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (විශිෂ්ට) (කො.වි.වි.)
අධ්‍යාපනපති උපාධිය (කො.වි.වි.)
ආර්ථික විද්‍යා ඩිප්ලෝමා (DED) (ඉංග්‍රීසි මාධ්‍ය) (කො.වි.වි.)
උසස් ඉංග්‍රීසි ඩිප්ලෝමා (DAE)1 (කො.වි.වි.)


2004/2006 M.phil./12


UCLIB
554682


කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ 2004/2006 අධ්‍යයන වර්ෂයේ අධ්‍යාපන දර්ශනපති පාඨමාලාවේ අවශ්‍යතා පුරණය සඳහා ඉදිරිපත් කරන නිබන්ධනය


නිබන්ධන උපදේශක
මහාචාර්ය රෝලන්ඩ් අබේපාල මහතා
අධ්‍යාපන පීඨය
කොළඹ විශ්ව විද්‍යාලය
කොළඹ

## සාරාංශය

වර්තමාන ගෝලීයකරණය (globalization) අභියස දැනුම පුපුරා යන (explosion) යුගයක අ.පො.ස. (උ. පෙළ) ඉගෙනීම ලබන ශිෂ්‍යයාට නවීන විද්‍යාත්මක දියුණුව හමුවේ ඇති ගැටලු වලට මුහුණ දී දැනුම ආකල්ප හා කුසලතා ලබා ගැනීමේදී ජය ගැනීමට සිදුවන අභියෝග බොහෝය. සමාජ පංති රටාව ආරම්භ වීමට සෘජුවම බලපාන සාධකයක් ලෙස අධ්‍යාපනය සැලකෙන හෙයින් අධ්‍යාපන පරමාර්ථ සහ අරමුණු මුදුන් පත් වීම තුළින් ශිෂ්‍යයාගේ පෞරුෂය (personality) වර්ධනය වීමට එය බෙහෙවින් ඉවහල් වේ. සජීවී දර්ශනයක් (living philosophy) වන අධ්‍යාපනය ශිෂ්‍යයාගේ ක්‍රියාකාරී බව තහවුරු කරමින් අධ්‍යාපන සාරධර්ම (educational values) ශිෂ්‍යයා තුළ ඇති කරමින් සමාජ සංවර්ධනය සඳහා පුද්ගල අභිලාශ මුදුන් පත් කරවනු ලබයි. අධ්‍යාපනය, ලෝක ගෝලීයකරණය (world globalization) යටතේ මුලු මහත් ශිෂ්‍ය සංහතියම එකම පිරිසකගෙන් යුක්ත බව තහවුරු කෙරෙන ලෝක සහෝදරත්වය (universal brother hood) වර්ධනය කරමින් සමාජ පරමාර්ථ සඳහා වටිනාකම් ආරෝපනය කරයි.

සමාජ සචලතාවය (social mobility) සඳහා නොමඳ පිටුබලයක් දෙනඅධ්‍යාපනය, එහි න්‍යාය බිහිකිරීමේදී අධ්‍යාපන දර්ශනය ප්‍රයෝජනයට ගන්නා අතර එමගින් එහි ක්‍රියාවලිය බිහිවේ. අධ්‍යාපනය නිශ්චිත ඉලක්ක කරා යොමු කිරීමේදී විෂය මාලා සංවිධානය (curriculum organization) උපකාරී වන අතර විශ්ව විද්‍යාල අධ්‍යාපනයට පිවිසෙන්නේ එම විෂය මාලාවේ ඇගයීම් සඳහා ඉහළ සාමාර්ථ්‍ය ලැබූ ශිෂ්‍යයින් පමණි. මේ යථාර්ථය ශ්‍රී ලංකාවේ ධන ව්‍යාප්තියේ විෂමතා (inequality of wealth distribution) ඇති කරවන අතර ඒ නිසා අධ්‍යාපන පරමාර්ථ (aims of education) හා සමාජ පංති (social groups) අතර ඇති සබඳතාවය විමසිය යුත්තකි.

ශිෂ්‍ය පෞරුෂය (personality) හැඩ ගැස්වීමේ ලා අධ්‍යාපනය ප්‍රබලව බලපාන අතර පුද්ගල ජීවනෝපාය සකස් කිරීමේ මාධ්‍යයක් ලෙසටද එය ක්‍රියාත්මක වේ. එහිදී පුද්ගල අභිලාශ හා අවශ්‍යතා ඉටුවන අතරම සමාජ කණ්ඩායමකට ශිෂ්‍යයන් එක්වීමෙන් සමාජය සකස් කිරීමේ මූලික කාර්යයද ශිෂ්‍යයන්ට පැවරේ. මෙසේ එකිනෙකාගේ ධන ආරෝපිත (positive charge) සමාජ පරමාර්ථ රටක අභිවෘද්ධිය සඳහා බෙහෙවින් බලපානු ලබයි.

එසේම සමාජ සංරක්ෂණය හා ප්‍රගතිය සඳහා ද සාමාජික හැසිරීම් වලින් ආභාෂ ලැබීම තුළින් සමාජ ප්‍රගමනය සඳහා ද එය හේතු කාරක වේ. සංස්කෘතික හා සදාචාරාත්මකව ඉදිරියට යන මිනිස් වර්ගයාගේ පැවැත්මට මේ අනුව සිදුවන බලපෑම අති මහත්ය.මේ සා විශාල කර්තව්‍යයක් කිරීමට පුද්ගලයා මෙහෙයවනු ලබන්නේ අධ්‍යාපනය හා බැඳුණු විභාග උසස් ලෙස සමත් වීමයි. අධ්‍යාපනයේ ඉහළම ප්‍රතිඵලය වන සමාජ ක්‍රියාකාරකම් (social activity) මනාව පවත්වා ගැනීම හා සමාජ ප්‍රගමනය සඳහා උරදීම ස්වයං සංවර්ධනය අභිබවා යන සාධක වේ.

ශිෂ්‍යයන්ගේ කාර්යඵලය (student performance) තීරණය කිරීමේදී කඩඉම් විභාගයක් වන අ.පො.ස. (උ. පෙළ) විභාගයේ අග්‍රස්ථ සාධනය මේ නිසා සුවිශේෂ වේ.

එහෙයින් ගම්පහ දිස්ත්‍රික්කයේ ජාතික පාසල් (national schools) වලින් 2005 වසරේ විශිෂ්ට සාමාර්ථ්‍ය ලත් සිසුන් 200 ක ගේ නියැදියක් තෝරා ගෙන ඔවුන්ගේ උසස් සාමාර්ථ්‍ය ලැබීමට හේතු වූ කරුණු පිළිබඳ විමර්ශනය කර ඉදිරිපත් කිරීම මෙම නිබන්ධනයේ අරමුණ විය.

මෙය වඩාත් වැදගත් පර්යේෂණයක් වන්නේ මේ පිළිබඳව කරන ලද දේශීය පර්යේෂණ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රචලිත නොවීමය.

මෙම පර්යේෂණයේ අධ්‍යයන අරමුණු වලට අදාළව දත්ත විශ්ලේෂණය කිරීමේදී අ.පො.ස. (උ. පෙළ) ශිෂ්‍යයන්ගේ ඉගෙනුම් සන්දර්භය (context) මනාව විග්‍රහ කිරීමකට ලක් වූ අතර ඒ සඳහා විදේශීය පර්යේෂණ සාහිත්‍යයෙන් උපුටා ගන්නා ලද ප්‍රශ්නාවලි (questionnaire)භාවිත කරන ලදි. එහිදී ශිෂ්‍යයන්ගේ ඉගෙනුම් ප්‍රවේශ (learning approaches) හා පාලන කේන්ද්‍ර (locus of control) ස්වභාව උප පරිමාන වලට බෙදා ඒ අනුව ප්‍රශ්නාවලියට අදාළ දත්ත එක්රැස් කර විශ්ලේෂණය කිරීමේදී ශිෂ්‍යයන්ගේ උසස් සාමාර්ථ්‍ය ලැබීමට ඒවා හේතු වන අන්දම විග්‍රහ කර දැක්වීමෙන් පර්යේෂණ නිගමන වලට එළඹීමට හැකිවිය. පර්යේෂණයේ දී තහවුරු වූ නිගමන හා ඉගෙනුම් පුරුදු සාර්ථකව යොදා ගත හැකි ආකාරය පිළිබඳ දැක්වූ නව යෝජනා මෙහි අවසාන පරිච්ඡේදයේ දක්වා ඇත.

Abstract

Students studying in the advance level classes face many challenges in acquiring knowledge, skills and attitudes to face problems they encounter in the modern scientific age which is subject to globalization and explosion of new knowledge.

Education is considered as a direct factor affecting social class and as such through achieving aims and objectives of education it will help students to develop their personality. Since education is considered as a living philosophy enhancing student activities and inculcating educational values would help the student to attain self ideals for social development.

Under globalization all of the students in the world become a team that enhance universal brotherhood inculcating values among them for social ideology.

Education readily assists for social mobility and its philosophy helps to build the theory of education and activity follows through its theory. Curriculum organization helps for target the aims of education and only students who score higher marks in the subjects enter universities.

This reality creates inequality of wealth distribution and therefore it is pertinent to find the relationship between aims of education and social groupings. Education affects personality development of the child acting as a medium of personal development. At this level personal expectations and needs get fulfilled and they more into a social group and bear the task of organizing the society. Thus their positive social aims helps for the progress of a country.

Influences gained through social behavior also helps to maintain and develop society and this also affects the existence of man moving forward culturally and morally. The leading force behind this paramount task is successfully passing the examinations in this education system. The highest results of education is maintains of social activity and social mobility are factors beyond self development.

As such in assessing student performance reaching high achievement levels in advance level examination is considered very specific.

Therefore a sample of 200 students were selected from national schools in the Gampaha district and the researcher assessed factors that lead to their high achievement levels. There are not many research studies of this type and therefore importance is very high.

Questionnaires from foreign literature were used to collect date according to the objectives of the study. The questionnaires carried sub-scales to assess learning approaches and locus of control and analyzed the factors that were responsible for their high achievement levels.

Through the analysis researcher reached conclusions and new suggestions have been included in the research that could be adopted by future students.